Lesson 27

# Conjunctions

සම්බන්ධක පද

අපි මේ පාඩමෙන් ඉගෙන ගන්නේ සම්බන්ධක පද පිළිබඳ. ඉංග්‍රිසි භාෂාව ඉගෙන ගන්නා කෙනෙකු ඉගෙන ගත යුතු ඉතාම වැදගත් පාඩමක් මේ පාඩම. සම්බන්ධක පද නොමැතිව ඉංග්‍රිසි භාෂාව හසුරවන්න අමාරුයි. ඒ භාෂාවේ සුහුරු කම එයට ලැබී තිබෙන එක හේතුවක් මේ සම්බන්ධක පද. සම්බන්ධක පද විස්සක් පමණ ඉංග්‍රිසි භාෂාවේ හඳුනාගත හැකියි. ඒ අතරින් අපට ඉතාම වැදගත් වන පහත සඳහන් සම්බන්ධක පද අපි මෙම පාඩමේදී ඉගෙන ගන්නවා.

| | | |
|---|---|---|
| And | ඇන්ඩ් | -සහ |
| But | බට් | -නමුත් |
| Because | බිකෝස් | -නිසා |
| Before | බිෆෝ | -පෙර |
| After | ආෆ්ට(ර්) | -පසු |
| When | වෙන් | -විට |
| While | වයිල් | -අතරතුර |
| Whether | වෙද(ර්) | -වේද නොවේද/ නැද්ද? |
| Till/until | ටිල්/ අන්ටිල් | -තුරු/ තෙක් |
| Though/although | දෝ/ඕල්දෝ | -වුවත් |
| Otherwise | අද(ර්)වයිස් | -එහෙම නැත්නම් |
| However | හව්එව(ර්) | -කොහොම වුනත් |
| If | ඉෆ් | -නම් |
| Unless | අන්ලස් | -නැත්නම් |
| So | සෝ | -ඒ නිසා |

අපි එක් එක් සම්බන්ධක පදයට උදාහරන ගෙන බලමු.

**And**- ඇන්ඩ්- මෙය භාවිතා වෙන්නේ ක්‍රියාවන් දෙකක් එකකට පසුව අනෙක සිදුවන විටදී.

Go and See!
ගෝ ඇන්ඩ් සී
ගිහිල්ලා බලන්න.

Come and eat something
කම් ඇන්ඩ් ඊට් සම්තිං.
ඇවිල්ලා මොනවා හරි කන්න.

He opened the door and went inside.
හී ඕපන්ඩ් ද ඩෝ ඇන්ඩ් වෙන්ට් ඉන්සයිඩ්.
ඔහු දොර ඇරගෙන ඇතුලට ගියා.

She pulled the curtain and smiled at me
ෂී පුල්ඩ් ද ක(ර්)ටින් ඇන්ඩ් ස්මයිල්ඩ් ඇට් මී
ඇය තිරය මෑත් කර මා සමග සිනා වුනා

He switched off the light and went to bed
හී ස්විච් ඕෆ් (ස්විචෝෆ් ) ද ලයිට් ඇන්ඩ් වෙන්ට් ටු බෙඩ්
ඔහු ලයිට් එක නිවලා ඇඳට ගියා

He came in and went straight to bed.
හී කේම් ඉන් ඇන්ඩ් වෙන්ට් ස්ට්‍රේට් ටු බෙඩ්.
ඔහු ඇතුළට ඇවිල්ලා කෙලින්ම ඇඳට ගියා.

He took his bag and left the house.
හී ටුක් හිස් බෑග් ඇන්ඩ් ලෙෆ්ට් ද හවුස්.
ඔහු ඔහුගේ බෑගය ගෙන නිවසෙන් පිට වුණා

She opened the book and started reading.
ෂී ඕපන්ඩ් ද බුක් ඇන්ඩ් ස්ටා(ර්ටඩ් රීඩිං.
ඇය පොත විවෘත කර කියවීම ආරම්භ කළා

He finished his work and went out for a walk
හී ෆිනිෂ්ඩ් හිස් ව(ර්ක් ඇන්ඩ් වෙන්ට් අවුට් ෆෝර් අ(ෆෝර) වෝක්
ඔහු තම වැඩ අවසන් කර ඇවිදින්න ගියා

She turned on the fan and sat down.
ෂී ට(ර්න්ඩ් ඔන් ද ෆෑන් ඇන්ඩ් සැට් ඩවුන්
ඇය ෆෑන් එක දාල ඉඳගත්තා

**But**- නමුත්

I can’t promise but I will try my best
අයි කාන්ට් ප්‍රොමිස් බට් අයි විල් ට්‍රයි මයි බෙස්ට්
මට පොරොන්දු වෙන්න බෑ. නමුත් මම උපරිම උත්සහ කරන්නම්

I rang her several times but she didn’t answer
අයි රෑං හ(ර්) සෙවරල් ටයිම්ස් බට් ෂී ඩිඩ්න්ට් ආන්ස(ර්)
මම කීපවරක් ඇගේ දුරකතනය නාද කලා නමුත් ඇය උත්තර දුන්නේ නෑ

She waited for months but there was no news from him
ෂී වේටට් ෆෝ මන්ත්ස් බට් දෙයා වෝස් නෝ නිව්ස් ෆොම් හිම්
ඇය මාස ගානක් බලා හිටියා නමුත් ඔහුගෙන් කිසිම ආරංචියක් ලැබුනෙ නෑ

I wanted to go out but it started raining
අයි වෝන්ටඩ් ටු ගෝ අවුට් බට් ඉට් ස්ටා(ර්)ටඩ් රේනිං
මම පිටවීමට කැමති වුණා නමුත් වැසි ඇරඹුණා

He tried to fix the car but he couldn't
හී ට්‍රයිඩ් ටු ෆික්ස් ද කා(ර්) බට් හී කුඩ්න්ට්
ඔහු කාර් එක හදන්න උත්සහ කළා නමුත් ඔහුට බැරිවුනා

I called him but he didn't pick up the phone
අයි කෝල්ඩ් හිම් බට් හී ඩිඩ්න්ට් පික් අප් (පිකප්) ද ෆෝන්
මම ඔහුට කෝල් කළා නමුත් ඔහු ෆෝන් එක ගත්තේ නැහැ

She wanted to join the class but it was full
ෂී වෝන්ටඩ් ටු ජොයින් ද ක්ලාස් බට් ඉට් වෝස් ෆුල්
ඇය පන්තියට සම්බන්ධ වීමට ඕන වුනා නමුත් ඒක පිරිලා තිබුනා

I was hungry but there was no food at home
අයි වෝස් හංග්‍රි බට් දෙයා වෝස් නෝ ෆුඩ් ඇට් හෝම්
මට බඩගිනි වුනා නමුත් ගෙදර කෑම මුකුත් තිබුනේ නැහැ

I wanted to call you but I forgot
අයි වෝන්ටඩ් ටු කෝල් යූ බට් අයි ෆොගොට්
මට ඔයාට කතා කරන්න ඕන වුනා නමුත් මට අමතක වුණා

He ran fast but couldn't catch the bus
හී රෑන් ෆාස්ට් බට් කුඩ්න්ට් කැච් ද බස්
ඔහු වේගයෙන් දිව්වා නමුත් ඔහුට බස් එක අල්ලගන්න බැරි වුණා

**Before**-පෙර

Give me a call before you come
ගිව් මී අ කෝල් බිෆෝ යූ කම්
ඔයා එන්න කලින් මට කෝල් එකක් දෙන්න

Think twice before you do anything
තිංක් ට්වයිස් බි ෆෝ යූ ඩූ එනිතිං
මොන දෙයක් වුනත් කරන්න කලින් දෙපාරක් හිතන්න (twice - දෙවරක්)

He was poor before he went abroad
හී වෝස් පුව(ර්) බිෆෝ හී වෙන්ට් අබ්‍රෝඩ්
රට යන්න කලින් ඔහු දුප්පත්

He went away before she saw him
හී වෙන්ට් අවේ බිෆෝ ෂී සෝ හිම්
ඔහු ඉවතට ගියා ඇය ඔහුව දකින්න කලින්

Give me the key before you go
ගිව් මී ද කී බිෆෝ යූ ගෝ
ඔයා යන්න කලින් මට යතුර දෙන්න

Give me a call before you come
ගිව් මී අ කෝල් බිෆෝ යූ කම්
ඔයා එන්න කලින් මට කෝල් එකක් දෙන්න

He worked with us before he went abroad
හී ව(ර්)ක්ඩ් විත් අස් (විතස්) බිෆෝ හී වෙන්ට් අබ්‍රෝඩ්
ඔහු රට යන්න කලින් ඔහු අපි සමග වැඩ කළා

Think hard before you take a decision
තිංක් හාඩ් බිෆෝ යූ ටේක් අ ඩිසිෂන්
ඔයා තීරණයක් ගන්න කලින් හොදට හිතන්න

Finish the work before I come
ෆිනිෂ් ද ව(ර්)ක් බිෆෝ අයි කම්
මම එන්න කලින් වැඩේ ඉවර කරන්න

We have to go there before it starts
වී හැව් ටු ගෝ දෙයා(ර්) බිෆෝ ඉට් ස්ටාට්ස්
ඒක පටන් ගන්න කලින් අපි එතනට යන්න ඕනා

Wash your hands before you eat
වොෂ් යුව(ර්) හැන්ඩ්ස් බිෆෝ යූ ඊට්
ඔයා කන්න කලින් අත් හෝදගන්න

Call me before you leave the house.
කෝල් මී බිෆෝ යූ ලීව් ද හවුස්
ඔයා ගෙදරින් පිටවෙන්න කලින් මට කෝල් කරන්න

Let’s have breakfast before we go out
ලෙට්ස් හැව් බ්‍රෙක්ෆස්ට් බිෆෝ වී ගෝ අවුට්
අපි එලියට යන්න කලින් උදේ කෑම කමු

They left before it rained
දේ ලෙෆ්ට් බිෆෝ ඉට් රේන්ඩ්
වහින්න කලින් ඔවුන් පිටත් වුනා

We need to check everything before we leave
වී නීඩ් ටු චෙක් එවරිතිං බිෆෝ වී ලීව්
අපි යන්න කලින් සියළු දේ පරීක්ෂා කරන්න ඕන

Close the windows before it gets dark
ක්ලෝස් ද වින්ඩෝස් බිෆෝ ඉට් ගෙට්ස් ඩාක්
කළුවර වෙන්න කලින් ජනෙල් වහන්න

Finish your homework before you watch TV
ෆිනිෂ් යුව(ර්) හෝම්ව(ර්)ක් බිෆෝ යූ වොච් ටීවී
ටීවී බලන්න කලින් ගෙදරවැඩ ඉවර කරන්න

**After**-පසු

He changed his mind after he saw the place
හී චේන්ජ්ඩ් හිස් මයින්ඩ් ආෆ්ට(ර්) හී සෝ ද ප්ලේස්
තැන දැක්කට පස්සේ ඔහු අදහස වෙනස් කරගත්තා

She rang up again after I got back home.
ෂී රෑං අප් අගේන් ආෆ්ට(ර්) අයි ගොට් බැක් හෝම්
මම ගෙදර ආවට පස්සේ ඇය ආපහු කෝල් කලා
(Ring up -යමෙකුට call කරනවා , එහි අතීත රූපය rang up )

After he died his family ill-treated his wife and children
ආෆ්ට(ර්) හී ඩයිඩ් හිස් ෆැමිලි ඉල්ට්‍රීටඩ් හිස් වයිෆ් ඇන්ඩ් චිල්ඩ්‍රන්
ඔහු මැරුණට පස්සේ ඔහුගේ පවුලෙ අය ඔහුගේ බිරිඳට සහ ළමයින්ට නරක විදියට සැලකුවා

I will tell you after I see it
අයි විල් ටෙල් යූ ආෆ්ට(ර්) අයි සී ඉට්
මම ඔයාට කියන්නම් මම ඒක දැක්කට පස්සේ

We will discuss this after she comes
අයි විල් ඩිස්කස් දිස් ආෆ්ට(ර්) ෂී කම්ස්
මම මේක සාකච්චා කරන්නම් ඇය ආවට පස්සේ

We will book the seat after you pay
වී විල් බුක් ද සීට් ආෆ්ට(ර්) යූ පේ
අපි සීට් එක බුක් කරන්නම් ඔයා ගෙව්වට පස්සේ

I will let you know after I take a decision
අයි විල් ලෙට් යූ නෝ ආෆ්ට(ර්) අයි ටේක් අ ඩිසිෂන්
මම තීරණයක් ගත්තට පස්සේ ඔයාට කියන්නම්

I didn't call him after he left the country
අයි ඩිඩ්න්ට් කෝල් හිම් ආෆ්ට(ර්) හී ලෙෆ්ට් ද කන්ට්‍රි
ඔහු රටින් ගියාට පස්සේ මම ඔහුට කෝල් කලේ නැහැ

I gave him some money after he finished the work
අයි ගේව් හිම් සම් මනි ආෆ්ට(ර්) හී ෆිනිශ්ඩ් ද ව(ර්)ක්
ඔහු වැඩේ ඉවර කලාට පස්සේ මම ඔහුට සල්ලි ටිකක් දුන්නා

I will call you after I finish
අයි විල් කෝල් යූ ආෆ්ට(ර්) අයි ෆිනිෂ්
මම ඉවර කලාට පස්සේ මම ඔයාට කෝල් කරන්නම්

Don’t go out after it gets dark
ඩෝන්ට් ගෝ අවුට් ආෆ්ට(ර්) ඉට් ගෙට්ස් ඩා(ර්)ක්
අඳුර වැටුනට පස්සේ එලියට යන්න එපා

I cleaned the room after they left
අයි ක්ලීන්ඩ් ද රූම් ආෆ්ට(ර්) දේ ලෙෆ්ට්
ඔවුන් ගියාට පස්සේ මම කාමරය පිරිසිදු කළා

Don’t talk after the teacher starts the lesson.
ඩෝන්ට් ටෝක් ආෆ්ට(ර්) ද ටීච(ර්) ස්ටාට්ස් ද ලෙසන්
ටීච(ර්) පාඩම පටන් ගත්තට පස්සේ කතා කරන්න එපා

They will leave after they eat.
දේ විල් ලීව් ආෆ්ට(ර්) දේ ඊට්
කෑවට පස්සේ ඔවුන් යාවි

I felt better after I took the medicine
අයි ෆෙල්ට් බෙට(ර්) ආෆ්ට(ර්) අයි ටුක් ද මෙඩිසින්
බෙහෙත් ගත්තට පස්සේ මට සුවයක් දැනුනා

I will tell you what to do after I see it myself
අයි විල් ටෙල් යූ වට් ටු ඩූ ආෆ්ට(ර්) අයි සී ඉට් මයිසෙල්ෆ්
මම කියන්නම් මොනවද කරන්න ඕනා කියලා මම ඒක දැක්කට පස්සේ. (මෙහි myself යෙදීමෙන් “මවිසින්ම එය දුටු පසු “ වැනි අර්ථය ලැබෙනවා )

**Because**-නිසා

She is happy because she passed the exam
ෂී ඉස් හැපී බිකෝස් ෂී පාස්ඩ් දි එග්සෑම්.
ඇය සතුටින් ඇය විභාගය පාස් වුන නිසා

I’m tired because I worked all day
අයිම් ටය(ර්)ඩ් බිකෝස් අයි ව(ර්)ක්ඩ් ඕල් ඩේ
මට මහන්සියි මම දිනය පුරා වැඩ කළ නිසා

I stayed at home because it was raining
අයි ස්ටේඩ් ඇට් හෝම් බිකෝස් ඉට් වෝස් රේනිං
මම ගෙදර හිටියා, අද වැස්ස නිසා

She cried because she lost her bag
ෂී ක්‍රයිඩ් බිකෝස් ෂී ලොස්ට් හ(ර්) බෑග්
ඇය ඇඩුවා ඇයගේ බෑගය නැති වුන නිසා

I went to bed early because I was sleepy
අයි වේන්ට් ටු බෙඩ් අ(ර්)ලි  බිකෝස් අයි වෝස් ස්ලීපි
මම වේලාසනින් නිදා ගන්න ගියා මට නිදිමත වුනු නිසා

She didn't come because she was sick.
ෂී ඩිඩන්ට් කම් බිකෝස් ෂී වෝස් සික්
ඇය ආවේ නැහැ ඇයට  අසනීප නිසා

She went home because she forgot her book.
ෂී වෙන්ට් හෝම් බිකෝස් ෂී ෆොගොට්  හ(ර්) බුක්
ඇය ගෙදර ගියා  ඇයට  පොත අමතක වුනු  නිසා

I couldn't call you because my phone died
අයි කුඩන්ට් කෝල් යූ බිකෝස් මයි ෆෝන් ඩයිඩ්
මට ඔයාට කෝල් කරන්න බැරිවුණා මගේ ෆෝන් එකේ බැටරි බැස්ස නිසා

They are worried because the exam is close
දේ ආ වොරීඩ්  බිකෝස්  දි එග්සෑම් ඉස් ක්ලෝස්
විභාගේ  ළඟ නිසා ඔවුන් අවිලෙන්  ඉන්නෙ

She fell because the floor was slippery.
ෂී ෆෙල් බිකෝස් ද ෆ්ලෝ වෝස් ස්ලිපරි.
ඇය වැටුනා පොලොව ලිස්සන සුළු වුනු නිසා

She is crying because the teacher blamed her
ෂී ඉස් ක්‍රයිං බිකෝස් ද ටීච(ර්) බ්ලේම්ඩ්  හ(ර්)
ඇය  අඬනවා ටීච(ර්) ඇයට  බැනපු නිසා

I'm running because I'm late
අයිම් රනිං බිකෝස් අයිම් ලේට්
මම දුවනවා මට පරක්කු නිසා

I will sleep early because I will have school tomorrow
අයි විල් ස්ලීප් අ(ර්ලි)  බිකෝස් අයි  හැව් ස්කුල් ටුමොරෝ
මට හෙට ස්කෝලේ  තියෙන නිසා මම වේලාසනින් නිදා ගන්නවා

I stay home because I feel very weak.
අයි ස්ටේ හෝම් බිකෝස් අයි ෆීල් වෙරි වීක්.
මම  ගෙදර ඉන්නවා මට හරි  දුර්වල ගතියක් දැනෙන නිසා

I can't come today because I am ill
අයි කාන්ට් කම් ටුඩේ බිකෝස් අයෑම් ඉල්
මට අද එන්න බෑ මට අසනීප නිසා

I got up very late today because my alarm didn't go off
අයි ගොට් අප් (ගොටප්) වෙරි ලේට් ටුඩේ බිකෝස් මයි එලාම් ඩිඩ්න්ට් ගෝ ඕෆ්
මම අද ගොඩක් පරක්කු වෙලා නැගිට්ටේ මගේ එලාම් එක වැදුනෙ නැති නිසා

I thought you were away from home because you didn’t answer my calls
අයි තෝට් යූ ව(ර්) අවේ ෆ්‍රොම් හෝම් බිකෝස් යූ ඩිඩ්න්ට් ආන්ස(ර්) මයි කෝල්ස්
ඔයා මගේ කෝල්ස් වලට ආන්ස(ර්) නොකරපු නිසා මම හිතුවා ඔයා ගෙදර නෑ කියලා

She decided to give up her job because it was difficult for her to travel from home
ෂී ඩිසයිඩඩ් ටු ගිව් අප් (ගිවප් ) හ(ර්) ජොබ් බිකෝස් ඉට් වෝස් ඩිෆිකල්ට් ෆෝ හ(ර්) ටු ට්‍රැවල් ෆ්‍රොම් හෝම්
ඇය තීරණය කළා රස්සාව අත හරින්න ඇයට ගෙදර ඉඳන් යන්න අමාරු නිසා
(Travel- ගමන් කරනවා)

I couldn ‘t see anything around me because it was very dark
අයි කුඩින්ට් සී එනිතින් අරවුන්ඩ් මී බිකෝස් ඉට් වෝස් වෙරි ඩාක්
මගේ අවට කිසිදෙයක් මට පෙනුනේ නෑ ඉතාම කළුවර වුනු නිසා

I didn’t buy it because it was very expensive
අයි ඩිඩ්න්ට් බයි ඉට් බිකෝස් ඉට් වෝස් වෙරි එක්ස්පෙන්සිව්
මම ඒක ගත්තේ නැහැ ඒක ගොඩක් මිල වෙච්චි නිසා

I didn’t do it because you told me not to
අයි ඩිඩ්න්ට් ඩූ ඉට් බිකෝස් යූ ටෝල්ඩ් මී නොට් ටු
ඔයා මට එපා කියපු නිසා මම ඒක කලේ නැහැ

- ❖ ඉහත before , after, because වැනි සම්බන්ධක පද යෙදෙන වාක්‍ය වල ඒ වාක්‍ය දෙක මාරැ කරගන්න පුලුවන් අර්ථයේ කිසිම වෙනසක් සිදුනොවී

He was poor before he went abroad
හී වෝස් පුව(ර්) බිෆෝ හී වෙන්ට් අබ්‍රෝඩ්
රට යන්න කලින් ඔහු දුප්පත්

↓

Before he went abroad he was poor
බිෆෝ හී වෙන්ට් අබ්‍රෝඩ් හී වෝස් පුව(ර්)
රට යන්න පෙර ඔහු දුප්පත්

He changed his mind after he saw the place
හී චේන්ජ්ඩ් හිස් මයින්ඩ් ආෆ්ට(ර්) හී සෝ ද ප්ලේස්
තැන දැක්කට පස්සේ ඔහු අදහස වෙනස් කරගත්තා

↓

After he saw the place he changed his mind
ආෆ්ට(ර්) හී සෝ ද ප්ලේස් හී චේන්ජ්ඩ් හිස් මයින්ඩ්
තැන දැක්කට පස්සේ ඔහු අදහස වෙනස් කළා

I thought you were away from home because you didn’t answer my calls
අයි තෝට් යූ ව(ර්) අවේ ෆ්‍රොම් හෝම් බිකෝස් යූ ඩිඩින්ට් ආන්ස(ර්) මයි කෝල්ස්
ඔයා මගේ කෝල්ස් වලට ආන්ස(ර්) නොකරපු නිසා මම හිතුවා ඔයා ගෙදර නෑ කියලා

Because you didn’t answer my calls I thought you were away from home
බිකෝස් යූ ඩිඩින්ට් ආන්ස(ර්) මයි කෝල්ස් අයි තෝට් යූ ව(ර්)  අවේ ෆ්‍රොම් හෝම්
ඔයා මගේ කෝල්ස් ආන්සර් නොකල නිසා මම හිතුවා ඔයා ගෙදර නැහැ කියලා

I didn’t buy it because it was very expensive
අයි ඩිඩින්ට් බයි ඉට් බිකෝස් ඉට් වෝස් වෙරි එක්ස්පෙන්සිව්
මම ඒක ගත්තේ නැහැ ඒක  ගොඩක් මිල වෙච්චි නිසා

Because it was very expensive I didn’t buy it
බිකෝස්  ඉට්  වෝස්  වෙරි එක්ස්පෙන්සිව් අයි ඩිඩ් න්ට් බයි  ඉට්
ඒක  ගොඩක් ගණන් නිසා මම ඒක  ගත්තේ නැහැ

I went to bed early because I was sleepy
අයි වේන්ට් ටු බෙඩ් අ(ර්)ලි  බිකෝස් අයි වෝස් ස්ලීපි
මම වේලාසනින් නිදා ගන්න ගියා මට නිදිමත වුනු නිසා

Because I was sleepy I went to bed early
බිකෝස් අයි වෝස් ස්ලීපි අයි වේන්ට් ටු බෙඩ් අ(ර්)ලි
මම වේලාසනින් නිදා ගන්න ගියා මට නිදිමත වුනු නිසා

I felt better after I took the medicine
අයි ෆෙල්ට් බෙට(ර්) ආෆ්ට(ර්) අයි ටුක් ද මෙඩිසින්
බෙහෙත් ගත්තට පස්සේ මට සුවයක් දැනුනා

After I took the medicine I felt better
ආෆ්ට(ර්) අයි ටුක් ද මෙඩිසින් අයි ෆෙල්ට් බෙට(ර්)
බෙහෙත් ගත්තට පස්සේ මට සුවයක් දැනුනා

We need to check everything before we leave
වී නීඩ් ටු චෙක් එවරිතිං බිෆෝ වී ලීව්
අපි යන්න කලින් සියළු දේ පරීක්ෂා කරන්න ඕන

Before we leave We need to check everything
බිෆෝ වී ලීව් වී නීඩ් ටු චෙක් එවරිතිං
අපි යන්න කලින් සියළු දේ පරීක්ෂා කරන්න ඕන

හොදයි , ඒ වාක්‍යය ඉතාම ඕනා කමින් අධ්‍යනය කරන්න. මේ සම්බන්ධක පද පාඩමෙන් පසු තමයි ඔබට සුහුරු ලෙස ඉංග්‍රීසි වාක්‍යය තැනීමේ  හැකියාව ලැබෙන්නේ. ඉහත සදහන් අනෙකුත් සම්බන්දක පද සදහා උදාහරන ඊලග පාඩම් දෙකේ අන්තර්ගතයි

Lesson 27

## Spoken English

මෙයත් එදිනෙදා සරළ කතා බහක්. මෙවැනි කතා බහ වැඩ කරන පරිසරයන් වල ඉතා සුලබයි. මෙවැනි කතා බහ **හොදින්** හසුරුවා ගත හැකිනම් ඔබට ඇත්තටම යමක් කරගත හැකියි. මෙවැනි සරළ කතාබහ හොදින් හුරුවූ විට ඊට වඩා **සංකීර්ණ** අදහස් ලේසියෙන්ම හුරුකරගත හැකියි. මේ කතාබහ තුලත් ඔබට ඉතාම වැදගත් ප්‍රයෝජනවත් වාක්‍ය සෑහෙන ප්‍රමානයක් තියෙනවා

Dialogue :-

A:- Have you finished ?

හැව් යූ ෆිනිෂ්ඩ් ?

ඔයා ඉවරද ?

B:- No, I have got a little more to do

**නෝ,** අයි හෑව් ගොට් අ ලිට්ල් මෝ ටු ඩූ

නෑ මට තව පොඩ්ඩක් තියෙනවා කරන්න (I have got = I have)

A:- How long will it take ?

හව් ලෝං විල් ඉට් (විලිට්) ටේක් ?

කොච්චර වෙලා යයිද ඒකට ?

B:- May be 10 minutes

මේ බී ටෙන් මිනිට්ස්

මිනිත්තු දහයක් වගේ වෙන්න පුළුවන්

A:- O.k , I will wait until you are finished

ඕ.කේ, අයි විල් වේට් අන්ටිල් යූ ආ ෆිනිෂ්ඩ්

හරි , මම ඉන්නම් ඔයා ඉවරවෙනකල්

After 10 minutes ....

A:- Haven't you finished yet ?

හැවන්ට් යූ ෆිනිෂ්ඩ් යෙට් ?

ඔයා තාම ඉවර නැද්ද ?

B:- I am almost finished. Just a few seconds more

අයෑම් ඕල්මෝස්ට් ෆිනිෂ්ඩ්. ජස්ට් අ ෆිව් සෙකන්ඩ්ස් මෝ

මම ඉවර වෙන්න ඔන්න මෙන්න. තව තප්පර කීපයයි

A:- Hurry up ! we are getting late

හරි අප් ! වී ආ ගෙටිං ලේට්

ඉක්මන් කරන්න ! අපි පරක්කු වෙනවා

B:- O.k, I've finished !

ඕ.කේ අයිව් ෆිනිෂ්ඩ්

හරි, මම ඉවරයි. (I’ve - I have වල කෙටි යෙදුම)

A:- Then, quickly get ready to go

දෙන් , ක්වික්ලි ගෙට් රෙඩි ටු ගෝ

එහෙනම් , ඉක්මනට යන්න ලෑස්තිවෙන්න

B:- Where is (where's) my bag ?

වෙයා(ර්) ඉස් (වෙයා(ර්)ස්) මයි බෑග් ?

මගේ  බෑග් එක කොහෙද ?

A:- I saw it here a few minutes before

අයි සෝ ඉට් හියු(ර්) අ ෆිව් මිනිට්ස් බිෆෝ

මම ඒක මෙතන දැක්ක මිනිත්තු කීපයකට කලින්

B:- Yes, I put it here but now It's gone

යස්, අයි පුට් ඉට් හිය(ර්) බට් නව් ඉට්ස් ගෝන්

ඔව් මම ඒක මෙතන තිබ්බා නමුත් දැන් ඒක නෑ (අතුරුදහන්)

A:- Look under the table

ලුක් අන්ඩ(ර්) ද ටේබල්

මේසේ යට බලන්න

B:- Oh, It's there, I have put it under the table

ඕහ්, ඉට් දෙයා , අයි හැව් පුට් ඉට් අන්ඩ(ර්) ද ටේබල්

ආ ඒක එතන තියෙනවා , මම ඒක මේසෙ යටින් තියල

A:- Check everything is in there

චෙක් එවුරිතිං ඉස් ඉන් දෙයා(ර්)

බලන්න හැමදේම එකේ තියෙනවද කියල

B:- Yeah, everything is there, nothing’s missing (nothing’s= nothing is )

යා, එව්රිතිං ඉස් දෙයා(ර්), නතිංග්ස් මිසිං

ඔව් හැමදේම තියෙනවා, මුකුත් මඟ ඇරිලා නැහැ

A:- Let's go, we are already late

ලෙට්ස් ගෝ, වී ආ ඕල්රෙඩි ලේට්

අපි යමු , අපි දැනටමත් පරක්කුයි

B: Wait a minute , I need to check everything once again

වේට් අ මිනිට් , අයි නීඩ් ටු චෙක් එව්රිතිං වන්ස් අගේන්

පොඩ්ඩක් ඉන්න , මට ආපහු ඔක්කොම චෙක් කරලා බලන්න ඕනා

A: Quickly , we are getting late . We have to catch the bus

ක්වික්ලි, වී ආ ගෙටිං ලේට් . වී හෑව් ටු කැච් ද බස්

ඉක්මනින්, අපි පරක්කු වෙනවා. අපිට බස් එක අල්ලගන්න තියෙනවා

After a second මොහොතකට පසු

B: Ok, We are going

ඕකේ , වී ආ ගොයින්

හරි , අපි යමු

A: Nilu , and Nishi , we are getting off . See you tomorrow . bye .....

නිලූ , නිෂි , වී ආ ගෙටින් ඕෆ් , සී යූ ටුමෝරෝව්

නිලූ , නිෂි , අපි යනවා , හෙට හමුවෙමු

N&N : See you tomorrow , take care , bye ....

සී යූ ටුමෝරෝව් , ටේක් කෙයා , බායි .....

හෙට හමුවෙමු , පරිස්සමින් ඉන්න , බායි

**Vocabulary 27**

Pull – පුල් – අදිනවා

Push – පුෂ් – තල්ලු කරනවා

Curtain – ක(ර්)ටන් – තිරය

Smile – ස්මයිල් – සිනහව / සිනාසෙනවා

Straight – ස්ට්‍රේට් – කෙළින් / ඍජු

Several – සෙව්රල් – කිහිපයක් / ගණනාවක්

Once – වන්ස් – එක් වරක්

Twice – ට්වයිස් – දෙවරක්

Thrice – ත්‍රයිස් – තුන්වරක්

Treat – ට්‍රීට් – සලකනවා , ප්‍රතිකාර කරනවා

Ill-treat – ඉල් ට්‍රීට් – අයහපත් ලෙස සලකනවා

Feel – ෆීල් – දැනෙනවා , හැඟෙනවා

Feel better – ෆීල් බෙට(ර්) – හොඳක් දැනෙනවා , සුවයක් දැනෙනවා

Slippery – ස්ලිපරි – ලිස්සන සුළු

meeting – මීටිං – රැස්වීම

party – පාටි – සාදය / පක්ෂය

fight – ෆයිට් – රණ්ඩුව

power cut – පව(ර්) කට් – විදුලිය කැපීම

guest – ගෙස්ට් – අමුත්තා

electricity – ඉලෙක්ට්‍රිසිටි – විදුලිය

toothache – ටූත් ඒක් – දත් කැක්කුම

strong – ස්ට්‍රෝං – ශක්තිමත්

strength – ස්ට්‍රෙන්ත් – ශක්තිය

stomachache  – ස්ටමක් ඒක් – බඩේ අමාරුව

current – කරන්ට් – විදුලි ධාරාව

current – කරන්ට් – දිය වැල

stranger – ස්ට්‍රේන්ජ(ර්) – ආගන්තුකයා

fertilizer – ෆ(ර්)ටිලයිස(ර්) – පොහොර

space craft – ස්පේස් ක්‍රාෆ්ට් – අභ්‍යවකාශ යානව

fever – ෆීව(ර්) – උණ

influenza – ඉන්ෆ්ලුවන්සා – හෙම්බිරිස්සාව

coriander – කොරිඇන්ඩ(ර්) – කොත්තමල්ලි

garlic – ගාලික් – සුදුලූනු

environment – එන්වයරමන්ට් – පරිසරය

Connected – කනෙක්ටඩ් – සම්බන්ධ වූ

Consider – කන්සිඩ(ර්) – සලකා බලනවා

Considerable – කන්සිඩරබල් – සැලකිය යුතු

Conspiracy – කන්ස්පිරසි – කුමන්ත්‍රණය

Costume – කොස්ටියුම් – ඇඳුම් පැළඳුම, වෙස් ඇඳුම

Cosy – කෝසි – සුවපහසු, උණුසුම් හැඟීමක් ඇති

Cotton – කොටන් – කපු

Crab – ක්‍රැබ් – කකුළුවා

Cripple – ක්‍රිපල් – ආබාධිත පුද්ගලයා,